ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන -පස්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2015

සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් – ESU3231

කාලය : පැය (03) තුනයි.

---

දිනය - 2015 අප්‍රේල් 06 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. 'සෞන්දර්ය' යන්න සංකල්පයක් වශයෙන් විභාග කරන්න.

02. සෞන්දර්ය අධ්‍යාපනයේ පොදු පරමාර්ථය සඳහන් කරන්න.

03. 'නිර්මාණාත්මක ක්‍රියාකාරකම්' යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.

04. කතන්දර ගෙතීම හරහා ශිෂ්‍යයන් ලබන ප්‍රතිලාභ පහක් (05) දක්වන්න.

05. "ජනසමාජය දැනුවත් කිරීමෙහි ලා සෞන්දර්ය මාධ්‍යය ප්‍රබලව යොදා ගත හැකිය." මේ සම්බන්ධ ඔබගේ අදහස් කෙටියෙන් දක්වන්න.

06. ශිෂ්‍යයන්ගේ ඉහළ ප්‍රජානන කුසලතා සංවර්ධනය කිරීමෙහි ලා සෞන්දර්ය විෂයයන් යොදා ගත හැක්කේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.

07. ළමා චිත්‍ර හා වැඩිහිටි චිත්‍ර අතර පවත්නා වෙනස්කම් සන්සංදනාත්මකව කෙටියෙන් විග්‍රහ කරන්න.

08. i. හයවන (6) ශ්‍රේණියේ දරුවන්ට ඉගැන්වීම සඳහා නාට්‍ය හා රංගකලා විෂයයේ ප්‍රායෝගික පාඩමක් තෝරා ගන්න. (ලකුණු 01)

ii. එම පාඩමට අදාළව ඔබට ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. i. හොවර්ඩ් ගාඩ්නර් ගේ බහුවිධ බුද්ධි න්‍යායේ බුද්ධි වර්ග නම් කරන්න. (ලකුණු 08)

ii. ඉන් ඔබ කැමති ඕනෑම බුද්ධි වර්ගයක් පිළිබඳව විස්තරයක් කරන්න. (ලකුණු 12)

10. "දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනයේ දී සෞන්දර්යය ගුරුවරයාගේ භූමිකාව අතිශයින් වැදගත් වේ." මෙහි සත්‍යාසත්‍ය බව විමසන්න. (ලකුණු 20)

11. "ඉගැන්වීමේ ප්‍රබල මාධ්‍යයක් වශයෙන් රූකඩ ක්‍රමය හැඳින්වීමට පුළුවන."

i. රූකඩ ක්‍රමය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 05)

ii. ඉගැන්වීමේ ලා ගුරුවරයාට රූකඩ ක්‍රමය යොදා ගත හැකි ආකාරය නිදසුන් සහිතව පෙන්වා දෙන්න. (ලකුණු 15)

12. " සෑම පුද්ගලයකුට ම සෞන්දර්ය පිළිබඳ දැනුවත්භාවය ජීවිතය පවත්වා ගැනීම සඳහා මහෝපකාරී වේ."

i. සෞන්දර්ය පිළිබඳ දැනුවත්භාවය යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

ii. සෞන්දර්ය පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීමෙහි ලා ජනමාධ්‍යයේ වගකීම කුමක්දැයි පෙන්වා දෙන්න. (ලකුණු 15)

13. සුසමාහිත පෞරුෂයක් ගොඩනැංවීමෙහි ලා සෞන්දර්ය විෂයයන්ගෙන් ලැබෙන්නේ කවරාකාර දායකත්වයක් දැයි විග්‍රහ කරන්න. (ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.